# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2255/22 – 2021 නොවැම්බර් මස 24 වැනි බදාදා – 2021.11.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 1/2012 (V)

**1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත**

1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 61 වන වගන්තිය යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

ඩග්ලස් දේවානන්දා,
ධීවර අමාත්‍ය.

2021 නොවැම්බර් මස 24 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

1. මේ නියෝග 2021 ධීවර (ගාස්තු පැනවීමේ) නියෝග ලෙස හඳුන්වනු ලැබිය යුතු අතර 2021.11.24 වන දින ක්‍රියාත්මකභාවයට එළඹිය යුතු ය.

2. මෙහි 1 වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් ගාස්තු එහි නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති බලපත්‍ර වර්ග සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.


1A – PG 05621 – 2510 (2021/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. මෙහි 11 වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් ගාස්තු එහි නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති මත්ස්‍ය පිරිසැකසුම් ආයතනවල ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

4. මෙහි 111 වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් ගාස්තු එහි නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති ආයතන ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

5. මෙහි IV වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් ගාස්තු එහි නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති යාත්‍රාංගන ලියාපදිංචි කිරීමට සහ අලුත් ධීවර යාත්‍රා නිෂ්පාදනය සඳහා බෝට්ටු අංක වෙන් කිරීමට අදාළ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

6. මෙහි V වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් ගාස්තු එහි නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

*(2 වන නියෝගය)*

### 1 වන උපලේඛනය

අගය එකතු කරන ලද ධීවර නිෂ්පාදන, අජීවී බෙල්ලන්ගේ කවච, අජීවී බෙල්ලන්ගේ කොටස්, සජීවි මසුන් සහ උපස්තර සන්තකයේ තබා ගැනීම, විකිණීම, ප්‍රදර්ශනය කිරීම, ප්‍රවාහනය කිරීම, ආනයනය කිරීම, අපනයනය කිරීම සහ ප්‍රති - අපනයනය කිරීම සම්බන්ධයෙන් වන ගාස්තු

| *බලපත්‍ර වර්ගය* | *බලපත්‍රය වලංගු කාලසීමාව සහ අය කරනු ලබන ගාස්තුව (රු.)* | *කිලෝ ග්‍රෑම් එකක් (1 Kg) සඳහා කැබලි එකක් සඳහා හෝ උපස්තරයක් සඳහා අයකරනු ලබන ගාස්තුව (රු.)* |
|---|---|---|
| පොකිරිස්සන් අපනයනය කිරීම සඳහා බලපත්‍රය | මාස 6 | කිලෝ ග්‍රෑම් එකක් (1 Kg) සඳහා රුපියල් විස්සක් (රු.20/-) |
| පොකිරිස්සන් සන්තකයේ තබා ගැනීම, විකිණීම, ප්‍රදර්ශනය කිරීම සහ ප්‍රවාහනය කිරීම සඳහා අවසරපත්‍ර නිකුත් කිරීම | අවුරුදු 1<br>රු. 5000/- | |
| හක් බෙල්ලන් අපනයනය කිරීම සඳහා අවසර පත්‍ර නිකුත් කිරීම | මාස 6 | හක් බෙල්ලන් එක් කැබැල්ලක් සඳහා රුපියල් 20ක් (රු.20/-) |
| හක්බෙල්ලන් සන්තකයේ තබාගැනීම, විකිණීම, ප්‍රදර්ශනය කිරීම සහ ප්‍රවාහනය කිරීම සඳහා අවසරපත්‍ර නිකුත් කිරීම | මාස 6<br>රු. 5000/- | |
| නක්ලා (Operculum of Chicoreus ramosus) අපනයනය කිරීම සඳහා බලපත්‍රය | මාස 6 | නක්ලා (Operculum of Chicoreus ramosus) එක් කැබැල්ලක් සඳහා රුපියල් දහයක් (රු. 10/-) |
| නක්ලා (Operculum of Chicoreus ramosus) සන්තකයේ තබාගැනීම, විකිණීම, ප්‍රදර්ශනය කිරීම සහ ප්‍රවාහනය කිරීම සඳහා අවසරපත්‍ර නිකුත් කිරීම | මාස 6<br>රු. 5000/- | |
| Chicoreus ramosus මාංශ අපනයන බලපත්‍රය | මාස 6 | කිලෝ ග්‍රෑම් එකක් (1 Kg) සඳහා රුපියල් විස්සක් (රු. 20/-) |
| Chicoreus ramosus මාංශ සන්තකයේ තබා ගැනීම, විකිණීම, ප්‍රදර්ශනය කිරීම සහ ප්‍රවාහනය කිරීම සඳහා අවසරපත්‍ර නිකුත් කිරීම | මාස 6<br>රු. 5000/- | |

| | | |
|---|---|---|
| විසිතුරු මසුන් අපනයනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම | මාස 6 රු. 10,000/- | |
| විසිතුරු මසුන් ආනයනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම | මාස 6 රු. 10,000/- | |
| විසිතුරු මසුන් ප්‍රති-අපනයනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම | මාස 6 රු. 10,000/- | |
| මුහුදු කුඩැල්ලන් අපනයනය කිරීම සඳහා අවසරපත්‍ර නිකුත් කිරීම | මාස 6 | කිලෝ ග්‍රෑම් එකක් (1kg) සඳහා රුපියල් විස්සක් (රු. 20/-) |
| මුහුදු කුඩැල්ලන් සන්තකයේ තබාගැනීම, විකිණීම, ප්‍රදර්ශනය කිරීම සහ ප්‍රවාහනය කිරීම සඳහා අවසරපත්‍රය නිකුත් කිරීම | මාස 6<br>රු. 5000/- | |
| මුහුදු කුඩැල්ලන් ආනයනය කිරීම සඳහා අවසරපත්‍ර නිකුත් කිරීම | මාස 6<br>රු. 5000/- | |
| මුහුදු කුඩැල්ලන් ප්‍රති-අපනයනය කිරීම සඳහා අවසරපත්‍රය නිකුත් කිරීම | මාස 6 | කිලෝ ග්‍රෑම් එකක් (1kg) සඳහා රුපියල් විස්සක් (රු. 20/-) |
| කෘතිම උපස්ථර මත මුහුදු ජීවී වගා අපනයනය කිරීම සඳහා අවසරපත්‍ර නිකුත් කිරීම | මාස 6 | උපස්ථර ඒකක එකක් (01) සඳහා රුපියල් පනහක් (රු. 50/-) |
| අජීවී මුහුදු බෙල්ලන්ගේ කවච ප්‍රවාහනය කිරීම, සන්තකයේ තබා ගැනීම සහ ප්‍රදර්ශනය කිරීම සඳහා අවසරපත්‍ර නිකුත් කිරීම | මාස 6 | කිලෝ ග්‍රෑම් දාහක් (1000kg) සඳහා රුපියල් පන්සියයක් (රු. 500/-) |
| මුහුදු තෘණ, ප්‍රවාහනය කිරීම සහ අපනයනය කිරීම සඳහා බලපත්‍රය නිකුත් කිරීම | මාස 6 | කිලෝ ග්‍රෑම් එකකට (1kg) සඳහා රුපියලක් (රු. 01/-) |
| මුහුදු තෘණ ආනයනය කිරීම සඳහා බලපත්‍රය නිකුත් කිරීම | මාස 6<br>රු. 1000/- | |
| මුහුදු තෘණ ප්‍රති-අපනයනය කිරීම සඳහා බලපත්‍රය නිකුත් කිරීම | | කිලෝ ග්‍රෑම් එකක් (1kg) සඳහා රුපියලක් (රු. 01/-) |
| විසිතුරු භාණ්ඩ සැකසීම සඳහා අජීවී බෙල්ලන් ප්‍රවාහනය කිරීම සඳහා අවසරපත්‍ර නිකුත් කිරීම | මාස 6<br>රු. 1000/- | |
| වෙනත් මසුන් සහ මත්ස්‍ය සම්පත් ආනයනය කිරීම සඳහා බලපත්‍රය නිකුත් කිරීම | | කිලෝ ග්‍රෑම් එකක් (1kg) සඳහා රුපියලක් (රු. 01/-) |
| වෙනත් මසුන් සහ මත්ස්‍ය සම්පත් අපනයනය කිරීම සඳහා බලපත්‍රය නිකුත් කිරීම | | කිලෝ ග්‍රෑම් එකක් (1kg) සඳහා රුපියලක් (රු. 01/-) |
| වෙනත් මසුන් සහ මත්ස්‍ය සම්පත් ප්‍රති-අපනයනය කිරීම සඳහා බලපත්‍රය නිකුත් කිරීම | | කිලෝ ග්‍රෑම් එකක් (1kg) සඳහා රුපියලක් (රු. 01/-) |

*(3 වන නියෝගය)*

## II වන උපලේඛනය

### මත්ස්‍ය පිරිසැකසුම් ආයතන සම්බන්ධයෙන් වන ගාස්තු

| *ක්‍රියාකාරකම* | *ගාස්තුව (රු.)* | *අලුත් කිරීමේ ගාස්තුවක් වේ නම් ඒ අලුත් කිරීමේ ගාස්තුව* |
|---|---|---|
| මත්ස්‍ය පිරිසැකසුම් ආයතන ලියාපදිංචි කිරීම | 50,000/- (පළමු ලියාපදිංචිය) | 50,000/- (ලියාපදිංචිය අලුත් කිරීම) |
| ස්වස්ථතා සහතිකය නිකුත් කිරීම | 500/- (එක් ස්වස්ථතා සහතිකයක් සඳහා) | |

| | | |
|---|---|---|
| මසුන් ඇල්ලීමේ සහතික සත්‍යෝක්ෂණ ගාස්තු | 200/- (එක් සහතිකයක් සඳහා) | |
| මත්ස්‍ය පිරිසැකසුම් ආයතන පරීක්ෂා කිරීම (අපනයනය කිරීම සහ ප්‍රති අපනයනය කිරීම සඳහා අනුමත ආයතන) | 25,000/- (එක් පරීක්ෂා කිරීමක් සඳහා) | |
| සාම්පල ලබාගැනීම සඳහා (*සැ.යු.* මේ ගාස්තුවට අමතරව, මෙහි දී ලබාගන්නා ලද සාම්පල පරීක්ෂාවන් සඳහා වන ගාස්තු ද බලපත්‍රලාභියා විසින් දරනු ලැබිය යුතුය) | 10,000/- | |

*(4 වන නියෝගය)*

## III වන උපලේඛනය

**මසුන් සහ මත්ස්‍ය නිෂ්පාදන, මත්ස්‍ය ඇම හා ධීවර කර්මාන්තය ආශ්‍රිත වෙනත් යම් උපකරණ ආනයනය කිරීම, අපනයනය කිරීම සහ ප්‍රති-අපනයනය සිදු කිරීමෙහි නිරත ආයතන ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් වන ගාස්තු**

| *ක්‍රියාකාරකම* | *පළමු ලියාපදිංචිය සඳහා වන ගාස්තුව (රු.)* | *අලුත් කිරීමේ ගාස්තුවක් වේ නම් ඒ අලුත් කිරීමේ ගාස්තුව (රු.)* |
|---|---|---|
| (කි.ග්‍රෑ 10,000කට වඩා අඩු) මසුන් සහ මත්ස්‍ය නිෂ්පාදන ආනයනය කරනු ලබන ආයතන ලියාපදිංචි කිරීම | 100,000 | 100,000 |
| (කි.ග්‍රෑ 10,000කට වඩා වැඩි) මසුන් සහ මත්ස්‍ය නිෂ්පාදන ආනයනය කරනු ලබන ආයතන ලියාපදිංචි කිරීම | 200,000 | 200,000 |
| (කි.ග්‍රෑ 10,000කට වඩා අඩු) මසුන් සහ මත්ස්‍ය නිෂ්පාදන අපනයනය කරනු ලබන ආයතන ලියාපදිංචි කිරීම | 50,000 | 50,000 |
| (කි.ග්‍රෑ 10,000කට වඩා වැඩි) මසුන් සහ මත්ස්‍ය නිෂ්පාදන අපනයනය කරනු ලබන ආයතන ලියාපදිංචි කිරීම | 100,000 | 100,000 |
| (කි.ග්‍රෑ 10,000කට වඩා අඩු) මසුන් සහ මත්ස්‍ය නිෂ්පාදන ප්‍රති-අපනයනය කරනු ලබන ආයතන ලියාපදිංචි කිරීම | 50,000 | 50,000 |
| (කි.ග්‍රෑ 10,000කට වඩා වැඩි) මසුන් සහ මත්ස්‍ය නිෂ්පාදන ප්‍රති-අපනයනය කරනු ලබන ආයතන ලියාපදිංචි කිරීම | 100,000 | 100,000 |
| මත්ස්‍ය ඇම ආනයනය කරනු ලබන ආයතන ලියාපදිංචි කිරීම | 25,000 | 25,000 |
| මසුන් ඇල්ලීමේ පන්න, යාත්‍රා, එන්ජින් සහ වෙනත් ධීවර ආම්පන්න සහ සේවා සපයනු ලබන ආයතන ලියාපදිංචි කිරීම | 25,000 | 25,000 |

(5 වන නියෝගය)

## IV වන උපලේඛනය

**අලුත් යාත්‍රා නිෂ්පාදනය කිරීම සඳහා ලියාපදිංචි අංක වෙන් කිරීම සහ යාත්‍රාංගන ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් වන ගාස්තු**

| *ක්‍රියාකාරකම* | *පළමු ලියාපදිංචිය සඳහා වන ගාස්තුව (රු.)* | *අලුත් කිරීමේ ගාස්තුවක් වේ නම් ඒ අලුත් කිරීමේ ගාස්තුව* |
|---|---|---|
| යාත්‍රාංගන ලියාපදිංචි කිරීම ( A කාණ්ඩය) | 30,000 | 30,000 |
| යාත්‍රාංගන ලියාපදිංචි කිරීම ( B කාණ්ඩය) | 15,000 | 15,000 |
| යාත්‍රාංගන ලියාපදිංචි කිරීම (C කාණ්ඩය) | 7,500 | 7,500 |

| | | |
|---|---|---|
| IMUL යාත්‍රාවක් නිෂ්පාදනය කිරීම සඳහා ලියාපදිංචි අංකයක් නිකුත් කිරීම | 75,000 | |
| IDAY යාත්‍රාවක් නිෂ්පාදනය කිරීම සඳහා ලියාපදිංචි අංකයක් නිකුත් කිරීම | 15,000 | |
| OFRP යාත්‍රාවක් නිෂ්පාදනය කිරීම සඳහා ලියාපදිංචි අංකයක් නිකුත් කිරීම | 7,500 | |
| MTRB යාත්‍රාවක් නිෂ්පාදනය කිරීම සඳහා ලියාපදිංචි අංකයක් නිකුත් කිරීම | 5,000 | |
| NBSB යාත්‍රාවක් නිෂ්පාදනය කිරීම සඳහා ලියාපදිංචි අංකයක් නිකුත් කිරීම | ගාස්තු අය නොකෙරේ | |
| NTRB යාත්‍රාවක් නිෂ්පාදනය කිරීම සඳහා ලියාපදිංචි අංකයක් නිකුත් කිරීම | ගාස්තු අය නොකෙරේ | |

*(6 වන නියෝගය)*

## V වන උපලේඛනය

### වෙනත් යම් ක්‍රියාකාරකම් සඳහා වන ගාස්තු

| *ක්‍රියාකාරකම* | *ගාස්තුව (රු.)* | *අලුත් කිරීමේ ගාස්තුවක් වේ නම් ඒ අලුත් කිරීමේ ගාස්තුව* |
|---|---|---|
| 2015 නීති විරෝධී, වාර්තා නොවූ සහ අවිධිමත් ධීවර කටයුතු වැළැක්වීමට, නතර කිරීමට හා පිටු දැකීමට වරායන් සහිත රාජ්‍යයන්ගේ පියවරයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ නියෝග යටතේ විදේශීය ධීවර යාත්‍රාවක් මගින් මසුන් ගොඩබෑම සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම | 25,000 එක් බලපත්‍රයක් සඳහා | |
| ධීවර නියමු බලපත්‍ර නිකුත් කිරීම | 5,000 (පළමුවන බලපත්‍රය) | 7,500 |
| ධීවරයන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම | කිසිදු ගාස්තුවක් අය නොකෙරේ. | 500 |
| ලොග් පොත් නිකුත් කිරීම | 2,000 (පළමු පොත නිකුත් කිරීම) | 2,000 (වෙනත් අලුත් පොතක් අවශ්‍ය වන්නේ නම්) |
| වෙනත් ස්ථානීය පරීක්ෂා සිදු කිරීම | එක් පරීක්ෂාවක් සඳහා 15,000 | |
| මාර්ගගත ක්‍රමය ඔස්සේ ධීවර බලපත්‍ර ලබා ගැනීමට ඇති පහසුකම සඳහා වන වාර්ෂික ගාස්තුව | 5,000 | |
| ධීවර දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතිය හරහා ලබාගනු ලබන වාර්තා සඳහා අය කිරීම | 50 (එක් පිටුවක් සඳහා) | |

12-114

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.